මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය - 2016

**Primary Piriven Year End Term Test - 2016**

**1 වසර /Grade 1**

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

# සිංහල
# SINHALA

කාලය : පැය 02 යි.
**Time : Two hours**

**පළමු ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 06කට පිළිතුරු සපයන්න.**

01. පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 100කට නො අඩු වාක්‍ය රචනයක් ලියන්න.
   1. අපේ පිරිවෙණ
   2. මම කුරුල්ලෙක් වෙමි.
   3. ආනන්ද හාමුදුරුවෝ.
   4. මව් පියන්ට සලකමු.
   5. මිහිඳු මහ පෙරහැර. (ලකුණු - 25 යි.)

02. අ) "ට" වර්ගයට අයත් සියලු අකුරු ලියන්න. (ලකුණු 05 යි.)

   ආ) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථ පද ලියන්න.
   1. මිරිදිය 2. ජය 3. ගුණ 4. සතුට 5. දිග
   (ලකුණු 05 යි.)

   ඇ) පහත සඳහන් පදවලට ස්ත්‍රී ලිංග පද ලියන්න.
   1. අශ්වයා 2. සිංහයා 3. නයා 4. වඳුරා 5. රජ
   (ලකුණු 05 යි.)

03. අ) පහත සඳහන් පද යොදා අදහස පැහැදිලි වන සේ වාක්‍යය බැගින් ලියන්න.
   1. විහාරය 2. බසය 3. උදෑසන 4. තරු 5. කීකරු
   (ලකුණු 05 යි.)

   ආ) "ණ" අකුර යෙදී තිබෙන වචන 5ක් ලියන්න.
   (ලකුණු 05 යි.)

   ඇ) පහත සඳහන් පිල්ලම් නම් කරන්න.
   1. ු 2. ෟ 3. ෙ 4. ි 5. ා
   (ලකුණු 05 යි.)

04. අ) පහත සඳහන් පද අකාරාදි පිළිවෙළට ලියන්න.
   ජපානය, සිංගප්පූරුව, තායිලන්තය, චීනය, ඉන්දියාව, නේපාලය, පාකිස්ථානය (ලකුණු 05 යි.)

   ආ) වාක්‍යයට ගැළපෙන සර්වනාම පද වරහන් තුළින් තෝරා ලියන්න.
   (මම, අපි, ඔහු, උෟ, නුඹ, ඒවා, එය)
   1. තුත්තිරි ගස ද ගසකි.......................... බෙහෙතට ගැනේ.
   2. .......................... පොත් පාඩම් කරමු.
   3. ගවයා සිව්පාවෙකි .......................... මිනිසාට උපකාර කරයි.
   4. .......................... සෙල්ලම් කළෙමි.
   5. .......................... ගමට යයි. (ලකුණු 10 යි.)

The National e-learning Portal for The General Education

05. පහත සඳහන් කවි සම්පූර්ණ කර නැවත ලියන්න.

අ) 1. ගඟ යන ඇත් කුණ ඉඳැ මස් රසටා.

2. පර සතුරන් එති එති යන බසටා. (ලකුණු 10 යි.)

ආ) "මනරම් නරදම් සැරිදම් සඟනට" යන්නෙහි සරල අදහස ලියන්න.

(ලකුණු 05 යි.)

06. අ) "නම් පොතෙන්" හා "මඟුල් ලකුණින්" උපුටාගත් පහත සඳහන් වචනවල හිස්තැන් පුරවන්න.

1. අ.........ත්.........න
2. .........මි.........ක්ක
3. සැ.........ලෙන
4. පුසු........., .........ටි.........
5. ඉ.........බා........., .........
6. න........ව.......දෙ.........ය
7. .........න්.........ළස්.........ක.........
8. චන්ද්‍ර.........ණ්........., .........දෙ.........ය
9. .........තා.........දෙ.........ය
10. ම.........දෙකය

(ලකුණු 10 යි.)

ආ) තම යහළුවෙකුට යවන සේ පෞද්ගලික ලිපියක් ලියන්න.

(ලකුණු 05 යි.)

07. අ) පහත සඳහන් වචනවල අදහස ලියන්න.

අතංගුව, අඩසඳ, අච්චු කරනවා, කුඩම්මා, මාරියාව (ලකුණු 05 යි.)

ආ) මඩොල් දූව හැර එම කතුවරයාගේ ග්‍රන්ථ 2ක් නම් කරන්න. (ලකුණු 05 යි.)

ඇ) දූවක් යනු කුමක් ද? පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

08. "මඩොල් දූව නව කතාව පුරාම පවතින්නේ ළමයින්ගේ වීරත්වය යි" නව කතාවේ ඔබ සිත්ගත් ළමා චරිත කිහිපයක් යොදාගෙන මෙම කියමන පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි.)